## පොලිස් පොත
ජපක කුඹුකගේ

හොරා කාගෙන...
මගේ වස්තුව පැහැරගෙන...
තතු විමසනව...
පොලිස් පොත දිගහැර ඒ ගැන...

දියමන්ති,රන්,මුතු,මැණික් අභරණ
තිබුනිද මුදල් කොපමණ?

මිල කළ නොහැක මට ඒ ගැන
අනේ සර්.......
මගේ වස්තුව හොරු පැහැරගෙන....

සේප්පුවකද තිබුනේ....
ඔය කියන වස්තුව....?

අනේ නෑ සර්....
මා අර පරිස්සම් කළා ....
යනෙන හැම තැන...

හුදකලාවේ.....තට්ට තනියම....
නිවසෙ අතැර වස්තුව
රැකියාවට පියඹුවා මා එහෙම....
කක්ෂඩ කාව මත
මොනිටර් කළා බැරිම තැන....

නිමා කොට වැඩ බිම
හනි හනික එන විට
හොරු රැගෙන....
දැන් නැත එතන....
බැලූව හැම තැන...

කේස් එක සිම්පල්...
අල්ලනව ඕකුන්ව අපි බෙල්ලෙන්...

දර්ශණ කිසිත් නැත එතන
අක්‍රීය කොට කාව...
පැහැර ගෙන මගේ වස්තු සම්පත....

ලයිෆ් ඉන්ෂුවරන්ස් පවා
දමා තිබුනේ වස්තුවට...

ලයිෆ් ඉන්ෂුවරන්ස්...?
මොලේ හොඳ නැතිද තමුන්ට...?

පණටත් වඩා ආදරෙයි මට
මගෙ වස්තුවට....

පපු කුහර....භූ චලනයක් මෙන්
දෙදරුම් කමින් ඇත...
විඳ දරා ගත නොහේ....හද සුනාමිය...
කිරි දරුවෝ දෙදෙනත්...
අනේ අසරණව වැතිර දැන් ගෙදර....

කාලය අනුභව නොකොට
දෙනවා ලිස්ට් එකක්....
අතුරුදන් වූ බඩු භාණ්ඩ...

*****************

දෑස් අග පොට පැන්න
උණු උණු කඳුලු ගලි ගලි...
ගිනියමින් විසුරුනා...
පොලිස් ඇන්ට්‍රි පිටුව මත...
පෙරකුරු බොඳ කරන්.....

කියනව අයිසෙ...ආලවට්ටන් නැතුව
මොනවද භාන්ඩ.....?

සර්....
මගෙ බිරිඳ....
පැහැර ගෙන....
ඇගෙ අනියම් පෙම....

## නූපන් මිතුරා වෙතටය!
ආනන්ද ගුණතිලක
හොපර්ස් ක්‍රොසිං

කෙනෙකුගෙ බෙල්ල කැපුමට දිය රෙද්ද අරං
ගින්දර රැගෙන ගිය හැකි දිය යටට කරං
සිඹ ගනු පිණිස දෙන අත ගෙන, කන්න හපං
මිනිහෙක් උනොත් මේ ලක්බිම උඹට මචං

අගේ ඉඳන් කණ කන්නට පුරුදු වෙ ලා
කේළම් ගොතා, ඒ මේ අත පතුර ව ලා
විලි බිය නැති විලස බේගල් අත හැර ලා
ජීවත් වෙන්න පුලුවනි නම්, උඹ දින ලා

දෙස්තරයෙක්, ගුරෙක්, වියතෙක් දැනුම පිරී
නැති නම් වේටරෙක් කොන්දෙක් වෙන්න හරී
ඉගෙනුම බැරි උනොත් පත පොත දෙසට හැරී
මන්තිරි කෙනෙක් විය හැක, අමන කම පිරී

සාරිපුත්ත - මුගලන් හිමි පෙරටු කොට
මහ රහතුන් වගේ දිදුලන සඟ වෙතට
දන් දිය හැකි නමුදු වැඩ ලෙස පර ලොවට
චීවර දරන, විලි බිය නැති 'හොරු' එමට

වස්තුව, මුදල්, තනතුරු වෙත දිව යන්න
අණාවින, හූනියම්, ගුරුකම් ජය ගන්න
'අමුතුම සාදුලා' හිටියත් දැක ගන්න
සිල්වත් හිමිවරුන් හිඟ නැත, වැඩ ඉන්න

පෙන්වා හොඳ මුහුණු, රඟ දෙන කල විලි යේ
අදමිටු, කුහක, වංචා ගති පිරුන ළයේ
දුදනන් ඇස ගැටෙන මුත්, විසි හතර පැයේ
නොම දත් විලස, උන් වෙත යා යුතුව තියේ

'සාධාරණය' ගැන හිතලා පලක් නැහැ
බොරුවෙන් රජ නොවී, යන එන කලක් නැහැ
හිත හොඳ වෙලා වැඩ කෙරුවොත් තැනක් නැහැ
ඒ දෙස බලා මෙහෙ බැලුවම, ඇහැක් නැහැ

'ගරු මැති සබය' ගව මඩුවකි අද දවසේ
මිරිස් කුඩු - කිණිසි නිතරම එහ ගැවසේ
මුලසුන උමතුවෙන් එහි වැජඹෙයි සුවසේ
රට දැය සමය වල පල්ලට යයි රහසේ

ජීවත් වීම අද, හැලියකි කසාය
'යහ ගුණ' 'සුදන ගති' මුදලින් වසාය
වෙස් බැඳ ගත් එවුන් වැදි බණ දෙසාය
ඉන්නේ මැරෙන්නට බැරිකම නිසාය

## මා දකින නත්තල.......
අශාන් කුමාරගේ

දිළිඳු වූ ගව ලෙනේ * උපන් දෙව් කුමරුණේ
ලොවෙහි ඇති කුරිරු බව * දුටිමි ඔබ වැඩි දිනේ
දහස් ගණනක් වසර * ගෙවා ඇතිමුත් මෙසේ
එදා දුටු නපුරමයි * අදත් ලොව රජ වුනේ

ආදරය නොහඳුනන * මිනිස් සිත් සතන් තුල
එකිනෙකා පරයමින් * ගැටෙන විට අවි දසත
හෙටක් ගැන අයැදිනා * නුඹ වැනිම බිළිඳුන්ට
කුමක් දෙන්නට වේද * අවි ගැටෙන යුද බිමක

කසීසලු පට දරා * සිටුවරුන් තව තැනෙක
රජ බොජුන් වලඳද්දි *සීත කල මැදුරු තුල
පිපාසෙට දිය බිඳක් * නැතිව දිව තෙමන්නට
අහිංසක දරු පැටවු * මිලිනවෙයි ලොව දසත

නුබ දෙසූ ඒ දහම * ලආදරය කරුණාවල
මිල මුදල් පොදිගැසී * යටවෙලා නොපෙනීම
අසල්වැසි මිනිසාට * පෙම් නොකරනා ලොවක
නුබ උපන් නත්තලත්* විකිණිලා මුදලටම

මුදා හැරලනු මැනව * කරුණාව දස දෙසම
එදා අසරණ ලොවට * විමුක්තිය දුන් ලෙසම
කියා දෙන්නට යලිත් * ලොවට ප්‍රේමයෙ අරුත
බලා හිඳිනෙමි යලිදු * වඩිනුමැන අප වෙතට

## නව වසර
ජයසේන කොඩිතුවක්කු
වත්තල

සාමයෙ හිරු රැසින් මුළු ලොව පිබිදේවා
කුල ගොත් භේද අඳුරින් ලොව මිදේවා
එක කුස දරුවෝ ලෙස හැම සිත් බැඳේවා
ලැබූ නව වසර සැමට ම ජය සැදේවා

හැම නිවසකම ලිප මත කිරි උතුරන්නයි
හැම දොරකඩම සතුටේ මල් පීදෙන්නයි
හැම දෙන සෙනෙහසින් තිර ලෙස බැඳෙෂන්නයි
ලැබූ නව වසර දහමින් සිත් පිරෙන්නයි

